# බුද්ධ චරිතය; අරියපරියේසන සූත්‍රය හා මහාවග්ගපාළිය ඇසුරෙන් කෙරෙන තුලනාත්මක අධ්‍යයනයක්

ඕපාත සමිත හිමි[1]

## හැඳින්වීම

බුදුරජාණන් වහන්සේ වනාහි භාරතීය ආගමික, දාර්ශනික ඉතිහාසය තුළ පහළ වූ ශ්‍රේෂ්ඨතම ශාස්තෘන් වහන්සේ ය. එබැවින් උන්වහන්සේගේ ඉගැන්වීම් සම්බන්ධයෙන් පමණක් නොව චරිත කථාව සම්බන්ධයෙන් ද ලෝකය පුරා බොහෝ දෙනෙක් පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යාත්මක මූලාශ්‍රය යොදාගනිමින් තවමත් පර්යේෂණවල නිරතවෙමින් සිටී. එම පර්යේෂණයන්ට අනුව බුද්ධ චරිතය සම්බන්ධයෙන් කරුණු රැසක් මේවනවිටත් අනාවරණය කර ගෙන ඇතිමුත් පාලි ත්‍රිපිටකයට හෝ තදට්ඨකථාවන්ට අයත් එක් මූලාශ්‍රයක් තුළ තථාගතයන් වහන්සේගේ බුද්ධත්වයේ සිට පරිනිර්වාණය දක්වා සියලු සිද්ධීන් ඇතුළත්ව ගොඩනැගුණු චරිත කථාවක් හඳුනාගත නො හැකි ය. මෙසේ ක්‍රමවත් ව ගොඩනැගුණු බුද්ධාපදානයක් හමුවන්නේ අශ්වඝෝෂපාදයන් විසින් රචනා කරන ලද බුද්ධචරිත මහා කාව්‍යයෙන් හා මහායානික සූත්‍රයක් වන ලලිතවිස්තරයේ පමණි. ථෙරවාදය තුළ බුද්ධ චරිතය සම්බන්ධයෙන් කරුණු ගොඩනැගී ඇත්තේ සූත්‍ර හා විනය යන පිටකද්වයේ මෙන් ම තදට්ඨකථාවන්හි ඇතුළත් කරුණු සැලකිල්ලට ගනිමිනි. එහි දී වඩාත් පැරණි හා වැදගත් මූලාශ්‍රය වන්නේ මජ්ඣිමනිකායට අයත් අරියපරියේසන සූත්‍රය හා විනයපිටකාගත මහාවග්ගපාළිය යි. මෙම මූලාශ්‍රය දෙකෙහි ම තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය, ප්‍රථම ධර්මදේශනය ආදී බොහෝ කරුණු සම්බන්ධ ව තොරතුරු දක්වා තිබුණ ද ඒවායේ යම් අසමානතාවන් දැකගත හැකි ය. ථෙරවාදී ත්‍රිපිටකයට අයත් පැරණිතම හා ඉතා වැදගත් මූලාශ්‍රය දෙකක බුද්ධ චරිතය සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු තුළ මෙසේ අසාමානතාවක් ඇතිවීම ගැටලු සහගත ය. එබැවින් මෙම මූලාශ්‍රය දෙක තුළ බුද්ධ චරිතය පිළිබඳ දක්වන කරුණු තුළ අසමානත්වයන් දැකගත හැක්කේ කුමන හේතුවක් නිසා ද යන්න විමර්ශනය කිරීම වැදගත් වේ.

## පර්යේෂණ ගැටලුව

බුද්ධ චරිතය සම්බන්ධ ව ඓතිහාසිකමය වශයෙන් කරුණු වාර්තා කිරීමේ දී අරියපරියෙසන සූත්‍රයේ හා මහාවග්ගපාළියේ යම් යම් වෙනස්කම් ඇතිවීමට කුමන හේතුසාධකයන් බලපා ඇත් ද යන්න විමසා බැලීම  මෙහි පර්යේෂණ ගැටලුව යි.

1. පූර්ණ කාලීන උපශාලාධිපති, ප්‍රඥාසාර භික්ෂු නේවාසිකාගාරය, කැලණිය විශ්වවිද්‍යාලය.
opathasamithathero@gmail.com

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ප්‍රධාන වශයෙන් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය (Qualitative Research Methodology) යටතේ සිදු වේ. එහි දී ත්‍රිපිටකය හා තදට්ඨකථාවන් ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ද මේ සම්බන්ධයෙන් විවිධ උගතුන් තොරතුරු සපයා ඇති පොතපත ආදිය ද්විතීයික මූලාශ්‍රය ලෙස ද යොදා ගැනේ.

**සාකච්ඡාව**

බුද්ධ චරිතයෙහි ඓතිහාසිකත්වය අධ්‍යයනය කිරීමේ දී මජ්ඣිමනිකායට අයත් අරියපරියේසන සූත්‍රය මෙන් ම විනය පිටකයට අයත් මහාවග්ගපාළිය අතිශය වැදගත් මූලාශ්‍රය දෙකකි. මෙම මූලාශ්‍රය දෙකෙහි ම තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය පිළිබඳ තොරතුරු මෙන් ම පළමු ධර්මදේශනාව පැවැත්වීම ආදි බොහෝ ඓතිහාසිකමය වැදගත්කමකින් යුතු කරුණු අන්තර්ගත ව ඇත. නමුත් මෙම මූලාශ්‍රය දෙක ම සන්සන්දනාත්මක ව අධ්‍යයනය කිරීමේ දී බුද්ධ චරිතය සම්බන්ධයෙන් දක්වා ඇති අදහස්හි යම් යම් අසමානකම් කිහිපයක් හඳුනාගත හැකි ය. විශේෂයෙන් අරියපරියේසන සූත්‍රයෙහි තථාගතයන් වහන්සේ පිළිබඳ තොරතුරු ආරම්භ වන්නේ අභිනිෂ්ක්‍රමණයේ සිට ය. එහි විස්තර වන පරිදි කලුවන් හිසකෙස් සහිත ව ඉතා තරුණ වියෙහි දී මාපියන් හඬද්දී ම බෝසතුන් කහවත් පොරවා ගිහිගෙයින් නික්මී ඇත. සූත්‍රය තුළ බෝධිසත්ත්ව චරිතය සම්බන්ධයෙන් කරුණු මෙසේ සඳහන් ව තිබුණ ද මහාවග්ගපාළියේ එවැන්නක් සඳහන් නො වේ. එහි බුද්ධ චරිතය ආරම්භ වන්නේ බුද්ධත්වයේ සිට ය.

සාම්ප්‍රදායික පිළිගැනීමට අනුව බුද්ධත්වයෙන් සති හතක් එනම් දින හතළිස් නවයක් ඇවෑමෙන් පසු ව පළමු ධර්මදේශනාව සිදු කිරීම සඳහා බුදුරදුන්ගේ අවධානය යොමුව ඇත. එහෙත් මහාවග්ගපාළියේ විස්තර වන්නේ බුද්ධත්වයෙන් දින විසි අටකට පසු ව එනම් සති හතරකට පසු ව පළමු ධර්මදේශනාව සඳහා බුදුරදුන් උනන්දු වූ බව යි. මෙම මතයන් දෙකට ම ප්‍රතිවිරුද්ධ අදහසක් ඉදිරිපත්ව ඇති අරියපරියේසන සූත්‍රයට අනුව බුදුරදුන් කැමති තරම් කාලයක් උරුවෙල් දනව්වේ වැඩසිට බරණැස ඉසිපතනය බලා වැඩම කොට ඇත. මහාවග්ගපාළියේ මෙන් සති හතරක් බුදුරදුන් ස්ථාන හතරක වැඩසිටීම අරියපරියේසන සූත්‍රයේ සඳහන් ව නොමැත්තේ කුමන කරුණක් නිසා ද යන්න මෙහි දී ගැටලු සහගත ය. සත් සතිය සම්බන්ධයෙන් සූත්‍ර හා විනය සාහිත්‍යය තුළ මෙසේ ඒකමතික අදහසක් ඉදිරිපත් නොවුන ද අටුවාචාරී බුද්ධඝෝෂ තෙරුන් පපඤ්චසූදනී හා අත්‍ථසාලිනී යන ස්වකීය අටුවා දෙකෙහි ම බුදුරදුන් බුද්ධත්වයෙන් පසු ව සති හතක් ස්ථාන හතක වැඩසිටි බව පැහැදිලි ව විස්තර කොට ඇත. එසේ සූත්‍ර සාහිත්‍යයේ හෝ විනය සාහිත්‍යයේ සඳහන් නොවන සති හතක් පිළිබඳ විස්තරයක් අටුවා යුගය වන විට නිර්මාණයවී ඇති බව එමගින් පැහැදිලි වේ.

බුදුරදුන් ඉසිපතන මිගදායට වැඩම කොට පස්වග තවුසන් උදෙසා පළමු ධර්මදේශනය පැවැත්වීම සම්බන්ධයෙන් මෙන් ම උන්වහන්සේලා සෝවහන් භාවයට පත්වීම සම්බන්ධයෙන් ද මෙම මූලාශ්‍රය දෙක දක්වන අදහස්හි යම් වෙනස්කමක් හඳුනාගත හැකි ය. මහාවග්ගපාළියට අනුව බුදුරදුන් පස්වග මහණුන් අමතා උතුම් චතුරාර්ය සත්‍ය ඇතුළත් ධර්මය දේශනා කොට ඇති අතර ඉන් පළමු ව සෝතාපන්න භාවයට පත්ව පැවිදි උපසම්පදාව ලැබුවේ කොණ්ඩඤ්ඤ තෙරුන් ය. ඉතිරි හතරදෙනා

අතරින් වප්ප හා භද්දිය යන තෙරවරුන් දෙවනුව ද මහානාම හා අස්සජි යන තෙරවරුන් දෙනම තෙවනුව ද සෝතාපන්න භාවයට පැමිණ පැවිදි උපසම්පදාවට පත්ව ඇත. මෙසේ පැවිදි උපසම්පදාව ලැබූ උන්වහන්සේලා සියල්ල රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණයන්හි ආදියෙහි ආදීනව ඇතුළත් බුද්ධ භාෂිතය අවබෝධ කිරීමෙන් පසු ව උතුම් අර්හත්වයට පත්වූ බව මහාවග්ගය අවසානයේ විස්තර වේ. නමුත් අරියපරියේසන සූත්‍රයේ මහාවග්ගපාළියේ මෙන් පස්වග මහණුන් සඳහා චතුරාර්ය සත්‍ය දේශනා කළ බවක් නොදක්වා පළමුවෙන් භික්ෂූන් තිදෙනෙක් පිඬු පිණිස යවා ඉතිරි දෙදෙනාට අවවාද කළ බව පමණක් දක්වා ඇත. මෙසේ පිඬු පිණිස වැඩි භික්ෂූන් තිදෙනාට අවවාද කොට ඇත්තේ පළමුවෙන් ධර්මය ශ්‍රවනය කළ භික්ෂූන් දෙනම පිඬු පිණිස යැවීමෙනි.

මහාවාග්ගපාළියෙහි ඉතා පැහැදිලි ව කොණ්ඩඤ්ඤ තෙරුන් පළමු ව ද ඉන් පසු ව වප්ප, භද්දිය, මහානාම, අස්සජි යන තෙරවරුන් පිළිවෙළින් සෝවාන් භාවයට පත්ව පැවිදි උපසම්පදාව ලැබූ බව දක්වා ඇතිමුත් අරියපරියේසන සූත්‍රයේ උන්වහන්සේලාගේ සෝවහන් භාවය පිළිබඳ ව හෝ පැවිදි වීම සම්බන්ධයෙන් තොරතුරක් සඳහන් ව නැත. සූත්‍රය තුළ විස්තර වන්නේ ජාති, ජරා, මරණ ධර්මතාවන්හි ආදීනව දැක පස්වග මහණුන් අර්හත්වයට පත්වූ බව පමණි. ඒ අනුව පස්වග තෙරවරුන් පිළිබඳ ව මහාවග්ගපාළියේ දීර්ඝ ලෙස කරුණු සඳහන් කර තිබුණ ද අරියපරියේසන සූත්‍රයෙහි ඉතා සංක්ෂිප්ත ව බුදුරදුන් ඒ පිළිබඳ දේශනා කොට ඇති බව ඉන් පැහැදිලි වේ.

**නිගමනය**

බුද්ධ චරිතය හා බැඳී ඇති කරුණු වාර්තා කිරීමේ දී ඉහත මූලාශ්‍රය දෙක අතරින් බුදුරදුන් විසින් ම දේශිත ශ්‍රීමුඛ දේශනාව වන්නේ මජ්ඣිමනිකායට අයත් අරියපරියේසන සූත්‍රය යි. එමෙන් ම මහාවග්ගපාළිය මහරහතන් වහන්සේලා විසින් සකස් කරනු ලබන්නේ පළමු ධර්ම සංගායනාවෙහි දී ය. ඒ අනුව මෙම මූලාශ්‍රය දෙක අතරින් බුද්ධ චරිතය පිළිබඳ වඩාත් පැරණි තොරතුරු අරියපරියේසන සූත්‍රයෙන් හමුවන අතර එය බුදුරදුන් විසින් ම දේශිත සූත්‍රයක් වන බැවින් කිසිදු ගැටලුවකින් තොර ව එහි ඇති කරුණු ද පිළිගැනීමට හැකියාවක් ඇත. නමුත් මහාවග්ගපාළියේ මෙන් විස්තරාත්මක කරුණු දැක්වීමක් එහි නො වේ. ඇතැම්විට බුදුරදුන් අවස්ථාවට අදාළ පරිදි සංක්ෂිප්ත ව (සංඛිත්තෙන) අරියපරියේසන සූත්‍රය තුළ කරුණු දේශනා කර ඇති බැවින් මහාවග්ගපාළියේ මෙන් විස්තරාත්මක කරුණු දැක්වීමක් එහි නො කළා විය හැකි ය. එමෙන් ම මහාවග්ගපාළිය පළමු ධර්ම සංගායනාවේදී මහරහතන් වහන්සේලා විසින් වාර්තාමය ස්වරූපයෙන් සංග්‍රහ කරන ලද බැවින් බුද්ධ චරිතය හා බැඳි ඓතිහාසිකමය කරුණු කිසිවක් මග නොහැර ඊට ඇතුළත් කිරීමට උත්සාහ ගෙන ඇතැයි ද සිතිය හැකි හෙයින් අරියපරියේසන සූත්‍රයේ සඳහන් නොවන කරුණු රැසක් මහාවග්ගපාළිය තුළ හඳුනාගත හැකි වේ.

**මුඛ්‍ය පද:** අරියපරියේසන සූත්‍රය, පස්වග මහණුන්, බුද්ධ චරිතය, මහාවග්ගපාළිය

## ආශ්‍රිත ග්‍රන්ථ


*සංයුත්තනිකාය v*, ධම්මචක්කප්පවත්තන සූත්‍රය, (2005), දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

කාරියවසම්, තිලක්, (2008), *මහායාන බුදුසමයේ බුද්ධ ක්ෂේත්‍ර සංකල්පය*, කොළඹ 10: ගොඩගේ සහ සහෝදරයෝ.

*පපඤ්චසූදනිය ii*, (2018), කොළඹ 10: හේවාවිතාරණ ග්‍රන්ථ භාරය.

*මජ්ඣිමනිකාය i*, අරියපරියේසන සූත්‍රය, (2005), දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*විනය පිටකය, මහාවග්ගපාළිය i*, (2005), දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*අත්ථසාලිනිය*, (2006), කොළඹ 10: හේවාවිතාරණ ග්‍රන්ථ භාරය.

ආනන්ද හිමි, කෝන්ගස්තැන්නේ, (1996), "කථාවත්ථුප්පකරණය" *අභිධර්මය වෙනම පිටකයක් ද?*, දෙහිවල: සීදේවි ප්‍රින්ටර්ස්.

*අනන්තලක්ඛණ සූත්‍රය*, (2005), දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.